සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අනාවරණ පරීක්ෂණය 2021

**06 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.**
- **01- 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියා දක්වන්න.**

01. පාසලක ප්‍රධාන පරිපාලන නිලධාරියා වන්නේ .................................................... ය.
(නියෝජ්‍ය විදුහල්පතිතුමා / විදුහල්පතිතුමා / අංශ ප්‍රධාන ගුරුභවතා)

02. ඔබේ පාසලේ ඉතිහාසය ඉගෙන ගැනීම සඳහා තොරතුරු ලබාගත හැකි වැදගත්ම මූලාශ්‍රය වන්නේ .................................................... පොත ය.
(ලොග් සටහන් / ලකුණු වාර්තා / පංති වාර්තා)

03. ඔබට ඔබගේ ඇතුලත්වීමේ දිනය හා අංකය නිවැරදිව ලබාගත හැකි වන්නේ .................................................... පරීක්ෂා කිරීමෙනි. (ලකුණු ලේඛනය / නාම ලේඛනය / ඇතුලත් කිරීමේ ලේඛනය)

04. ඔබ සුවිශේෂී පුද්ගලයකි. ඔබට සමාන කිසිවෙකු නැත. ඔබ ඔබම විය යුතුයි එය ඔබගේ .................................................... වේ. (අභිමානය / අනන්‍යතාවය / අභිලාෂය)

05. ශිෂ්‍යයෙකු තුළ තිබිය යුතු යහපත් ගති ලක්ෂණයක් වන්නේ .................................................... ය.
(සත්‍යවාදීබව / කලහාකාරී බව / ආත්මාර්තකාමී බව)

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ හරිනම් (✓) ලකුණ ද, වැරදිනම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06. ගුරු සිසු ඇගයීම් කටයුතු හා විනය කටයුතු සොයා බැලීම විදුහල්පති භූමිකාවේ කාර්යයකි. ( )

07. පාසලේ ළමයින්ගේ අධ්‍යාපන කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සැපයීම අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වගකීමක් වේ. ( )

08. 06 ශ්‍රේණියේ ඉගෙන ගන්නා දරුවෙකු ලෙස ඔබගේ සම්පූර්ණ නම නිවැරදිව තහවුරු කරගත හැකි වන්නේ විදුහල්පති තුමාගේ විමසීමෙනි. ( )

09. පුද්ගලයකු සතු හැකියා දක්ෂතා වැඩිදියුණු කර ගැනීම සඳහා යොදාගත හැකි ප්‍රබල මාධ්‍යයක් වන්නේ අසභ්‍ය වීඩියෝ පට දර්ශන නැරඹීමයි. ( )

10. සෑම අභියෝගයක්ම ජීවිත සාර්ථකත්වයට තුඩුදෙන ශක්තියක් බවට පත්කර ගත හැකිය. ( )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල දී ඇති පිළිතුරු අතුරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. පාසලේ ශිෂ්‍යයකුගේ සංවර්ධනය උදෙසා උපකාරී වන්නේ පාසලෙන් ලැබෙන කුමන වටිනා කරුණු දැයි පිළිතුරු අතරින් තෝරන්න.

(1) දැනුම පමණක් වේ. (2) ආකල්ප පමණක් වේ.
(3) පුරුදු පමණක් වේ. (4) දැනුම, ආකල්ප, කුසලතා හා පුරුදු සියල්ලම වේ.

12. පාසල් ශිෂ්‍යයෙක් ලෙස කාලය ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට නම් ඔබ කළ යුතු වඩාත් නිවැරදි ක්‍රියාමාර්ගය වන්නේ මින් කුමක් ද?
(1) සෑම වැඩක්ම දිනෙන් දිය කල් දැමීම. (2) දෛනික කාලසටහනක් පිළියෙලකර ගැනීම.
(3) මව හෝ පියා ලවා වැඩ කරවා ගැවීම. (4) සතියකට එක් දිනක් පමණක් පාසල් යාම.

13. සෑම පාසලක්ම තම පාසලට විශේෂිත වූ නීති පද්ධතියක් සකස්කරගෙන ඇත. පාසලකට නීති පද්ධතියක් අවශ්‍ය වන්නේ,
(1) ළමයින් විනය විරෝදී පිරිසක් බවට පත්කිරීම සඳහාය.
(2) විදුහල්පති තුමාගේ සහ ගුරුමණ්ඩලයේ සැප පහසුව සඳහාය.
(3) පාසල තුළ හොඳ ඉගෙනුම් වාතාවරණයක් ගොඩනැගීම සඳහාය.
(4) අවට ප්‍රජාවගෙන් ප්‍රශංසා ලැබීම සඳහාය.

14. පහත සඳහන් කරුණු අතරින් පාසල් ගීයෙන් ඉටුනොවෙන කාර්යයන් වන්නේ මින් කුමක් ද?
(1) පාසල මවක ලෙස සැලකීම.
(2) පාසලේ අනන්‍යතාවය ආරක්ෂා කිරීම.
(3) සිසුන්තුළ ගෞරවය හා අභිමානය ඇති වීම.
(4) පාසලෙන් ජාතියට සිදුවන මෙහෙය පිළිබඳ සිතුවිලි සිසුන් තුළ ජනිත නොවීම

15 සමාජයෙන් පාසලට සැලසෙන සේවාවක් ඇතුළත් නිවැරදි පිළිතුර වන්නේ මින් කුමක් ද?
(1) පාසල සතු සම්පත් අයතා ලෙස ප්‍රයෝජනයට ගැනීම.
(2) පාසලේ සංවර්ධනයට බාධා කිරීම.
(3) පාසලේ පැවැත්වෙන විවිධ උත්සවයන්ට සහභාගී වීම.
(4) විවිධ සංවිධාන මගින් පාසලට ලබාදෙන සේවා වැළැක්වීම.

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පින්තූර ඇසුරින් පිළිතුරු ලියන්න.**



16. A පින්තූරයේ දැක්වෙන අවස්ථාවකට ඔබ සම්බන්ධ වුවහොත් ඔබ ලබන අත්දැකීම් දෙකක් ලියන්න.
(1) ..................................................................
(2) ..................................................................

17. එවැනි අවස්ථාවක දී සිදුවිය හැකි අනතුරු දෙකක් ලියන්න.
(1) ..................................................................
(2) ..................................................................



A B C D

18. ඉහත A B C D වලින් දැක්වෙන පින්තූර හොඳින් නිරීක්ෂණය කර ස්වාභාවික සම්පත් හා මිනිසා නිර්මාණය කළ සම්පත් වෙන්කර දක්වන්න.
ස්වාභාවික සම්පත් - (1) .............................. (2) ..............................
මිනිසා නිර්මාණය කළ - (1) .............................. (2) ..............................

19. ස්වාභාවික සම්පත්වලින් ලබාගත හැකි ප්‍රයෝජන දෙකක් ලියන්න.
(1) .............................. (2) ..............................

20. මිනිසා නිර්මාණය කළ සම්පත්වලින් ලබාගත හැකි ප්‍රයෝජන දෙකක් ලියන්න.
(1) .............................. (2) ..............................

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නයත් 2 - 7 දක්වා ප්‍රශ්නවලින් ප්‍රශ්න හතරකුත් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.
- පළමු ප්‍රශ්නය සඳහා ලකුණු 16 ක් ද, 2 - 7 දක්වා ප්‍රශ්නවලට ලකුණු 11 බැගින් ද හිමි වේ.

01. (i) පහත් දැක්වෙන පාසලේ සංවිධාන ව්‍යුහයේ හිස්තැනට ගැලපෙන පිළිතුර ලියන්න.




(ලකුණු 05)

(ii) පාසලේ සංවිධාන ව්‍යුහයක දක්නට ලැබෙන කමිටු 04 ක් නම් කරන්න.

(1) ................................................ (2) ................................................

(3) ................................................ (4) ................................................ (ලකුණු 04)

(iii) 06 ශ්‍රේණියේ ඉගෙන ගන්නා ශිෂ්‍යයෙකු ශිෂ්‍යාවක වන ඔබ විසින්ම ඔබව නිවැරදිව හඳුනාගැනීම සඳහා උපයෝගී කරගත හැකි කරුණු 04 ක් ලියන්න.




(ලකුණු 04)

(iv) පාසලේ ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී 06 ශ්‍රේණියේ ගණිත විෂය ප්‍රවීණතාවය සඳහා ඔබට ද ත්‍යාගයක් හිමි වූයේ යැයි සිතන්න. ත්‍යාග ලබාගැනීමෙන් ඔබට ඇති වූ හැඟීම් 03 ක් ලියන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

(3) .......................................................................................... (ලකුණු 03)




02. (i) ඉහත දැක්වෙන්නේ සැලසුම්කරණය හා සංවිධානය නිසා අත්වන වාසි ඇතුළත් සටහනකි. එම සටහනේ A B C D E වලින් දක්වෙන හිස්තැන් පුරවන්න.

A .......................................... B ..........................................

C .......................................... D ..........................................

E .......................................... (ලකුණු 05)

(ii)

| |
|---|
| වැඩ කල් දමයි / ක්‍රමානුකූලව කටයුතු කරයි / පසුතැවීමට ලක්වෙයි / ආතතියෙන් යුතුවෙයි / තම අරමුණු ඉටුකරගනියි / අභියෝග ජය ගනියි |

ඉහත දක්වෙන්නේ සැලසුම් සහගත ශිෂ්‍යයකු හා සැලසුම් සහගත නොවන ශිෂ්‍යයකු තුළ දක්නට ලැබෙන ලක්ෂණ කිහිපයකි. ඒ ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| සැලසුම් සහගත ශිෂ්‍යාගේ ලක්ෂණ | සැලසුම් සහගත නොවූ ශිෂ්‍යාගේ ලක්ෂණ |
|---|---|
| 01 .......................................... | 01 .......................................... |
| 02 .......................................... | 02 .......................................... |
| 03 .......................................... | 03 .......................................... |

(ලකුණු 06)

03 (i) පාසල් ගීතය හා පාසල් කොඩිය හැර ඔබ පාසලේ අනන්‍යතාව පිළිබිඹු කරන සංකේත 04 ක් ලියා දක්වන්න.

(1) .......................................... (2) ..........................................

(3) .......................................... (4) ..........................................

(ලකුණු 04)

(ii) ඔබ පාසලේ පාසැල් කොඩිය භාවිතා කරන අවස්ථා තුනක් ලියන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

(3) .............................................................................................................. (ලකුණු 03)

(iii) පාසලක පවත්නා සම්ප්‍රදායන් ආරක්ෂා කිරීමේ ප්‍රයෝජන 04 ක් ලියන්න.

(1) .................................................... (2) ....................................................

(3) .................................................... (4) ....................................................(ලකුණු 04)

04 (i) රූප සටහනේ දැක්වෙන්නේ අප ජීවත්වන ප්‍රදේශයේ පරිපාලන රටාවයි. එහි A, B, C වලින් දැන්වෙන හිස්තැනට සුදුසු පිළිතුර ලියන්න.




A ..............................................................................

B ..............................................................................

C ..............................................................................(ලකුණු 03)

(ii) සමාජ අවශ්‍යතා ඉටුකිරීම සඳහා භූමිය යොදාගන්නා අවස්ථා 04 ක් ලියන්න.

(1)..................................................... (2) .....................................................

(3)..................................................... (4) ..................................................... (ලකුණු 04)

(iii) භෞතික සම්පත් සංරක්ෂණයට ගතහැකි ක්‍රියාමාර්ග 04 ක් ලියා දක්වන්න.

(1)..................................................... (2) .....................................................

(3)..................................................... (4) .....................................................(ලකුණු 04)

05



A B C D

(i) ඉහත පින්තූරවලින් දැක්වෙන පුද්ගලයින් පහත දැක්වෙන ප්‍රභේද දෙකට නිවැරදිව වෙන්කර දක්වන්න.

කායික හැකියා → (1) ..............................................................
→ (2)..............................................................

මානසික හැකියා (බුද්ධිමය හැකියා) → (1) ..............................................................
→ (2)........................................................ (ලකුණු 02)

(ii) පහත වගුවේ දැක්වෙන්නේ ඔබ ජීවත්වන ප්‍රදේශයේ දක්නට ලැබෙන සම්පත් කිහිපයකි. එම සම්පත් ආශ්‍රිතව ඇතිවන නිෂ්පාදන ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| සම්පත් | සම්පත් ආශ්‍රිත නිෂ්පාදන |
|---|---|
| මැටි | 1 .................................. 2 .................................. |
| කොහු | 1 .................................. 2 .................................. |
| පොල් ඉරටු | 1 .................................. 2 .................................. |

(ලකුණු 06)

(iii) විවිධ අවස්ථාවල දී පුද්ගලයින් සාමුහිකව කටයුතු කරන අවස්ථා දක්නට ලැබේ. සාමුහිකව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන 03 ක් ලියන්න.

සාමූහිකව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන →
(1) ..............................................................
(2) ..............................................................
(3) .............................................................. (ලකුණු 03)

06 (i) එදිනෙදා කටයුතු ඉටුකර ගැනීමේ දී අපට උදව්වන ආයතන 03 ක් නම් කරන්න.

(1) ..............................................................
(2) ..............................................................
(3) .............................................................. (ලකුණු 03)

(ii) ඔබ ජීවත්වන ප්‍රදේශයේ විවිධ සමිති දක්නට ලැබෙන අතර එමගින් සේවා රැසක් ඉටුවේ. ඒ ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| සමිතිය | සිදුවන සේවා |
|---|---|
| අවමංගල්‍යාධාර සමිතිය | 01 ........................<br>02 ........................ |
| සමූපකාර සමිතිය | 01 ........................<br>02 ........................ |
| ගොවි සමිතිය | 01 ........................<br>02 ........................ |

(ලකුණු 06)

(iii) ඔබට සේවා සපයන ආයතන වලට ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් දෙකක් ලියන්න.

(1) .............................................. (2) .............................................. (ලකුණු 02)

07 (i) පහත දක්වෙන උපකාරක පද ඇසුරින් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

<u>පහළට</u>

(1) සක්‍රීයව සවන්දීමක් සිදුවීමට මෙය තිබිය යුතුයි.
(2) ආචාරශීලී කථනයේ අංගලක්ෂණයකි.
(5) මනා විනයක් හා ශික්ෂණයක් පවත්වා ගැනීමෙන් මෙවැනි සමාජයක් බිහිවේ.

<u>හරහට</u>

(3) භාෂාව හැසිරවීමේ දී අවධානය යොමුකළ යුතු කරුණු තුනෙන් එකකි.
(4) විනය හා ශික්ෂණය සඳහා ප්‍රගුණ කළ යුතු ගුණාංගයකි.
(6) නීතිරීති අනුගමනය කිරීමෙන් මෙවැනි නායකයක් බිහිවේ.




(ලකුණු 06)

(ii) පොදු දේපළවල ලක්ෂණ දෙකක් ලියන්න.

(1) .............................................. (2) .............................................. (ලකුණු 02)

(iii) පොදු දේපළ ආරක්ෂා කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග තුනක් ලියන්න.

(1) ..............................................................
(2) ..............................................................
(3) ..............................................................

(ලකුණු 03)

## I කොටස

01. විදුහල්පතිතුමා 02. ලොග් සටහන් 03. ඇතුලත් කිරීමේ ලේඛන 04. අනන්‍යාවය 05. සත්‍යවාදී බව
06. ✓ 07. ✓ 08 × 09 × 10. ✓ 11. 4 12. 2 13. 3 14. 4
15. 3 16. සහයෝගයෙන් එකමුතුව කටයුතු කිරීම / සතුටක් විනෝදයක් ලැබීම / නායකත්වයට ගරු කිරීම / අන්මත ඉවසීම (නිවැරදි පිළිතුරට ලකුණු දෙන්න)
17 කකුල කැඩීම / ක්ලාන්ත වීම / ගස් අතු ඇඟමත වැටීම ආළ නිවැරදි පිළිතුරුවලට ලකුණු ලබා දෙන්න.
18. ස්වාභාවික සම්පත් ⟶ A හා C / මිනිසා නිර්මාණව කළ ⟶ B හා D
19. කෘෂිකාර්මික කටයුතු / පානීය ජල අවශ්‍යතා සපුරා ගැනීම / සෙවණ ලබා දීම / දැව ලබා දීම / වාතය පිරිසිඳු කිරීම / බලශක්ති නිපදවීම
20. ප්‍රවාහන කටයුතු සඳහා / කර්මාන්තශාලා ඉදිකිරීම ආදී අදාළ පිළිතුරුවලට ලකුණු ලබා දෙන්න.

## II කොටස

01. (i) (1) සිසුන් (2) ශිෂ්‍ය නායක නායිකාවන් (3) ශ්‍රේණිභාර ගුරුභවතුන්
(4) විදුහල්පතිතුමා (5) ආදිශිෂ්‍යයින්
(ii) ක්‍රීඩා කමිටු / සුබසාධක කමිටුව / පරිසර කමිටුව / ආගමික කමිටුව (පෙළපොත 09 පිටුව)
(iii) දක්ෂතා / දුර්වලතා / හොඳගති ලක්ෂණ / අභියෝග / පෞද්ගලික තොරතුරු (මෙයින් 04 ක් ලියා ඇත්නම් ලකුණු දෙන්න)
(iv) සතුටක් ඇතිවීම / අභිමානයක් ඇතිවීම / සැමදාම ප්‍රවීනතාවය ලබා ගැනීමට හැකවීම / පවුලේ අයට සතුට ඇති වීම / පවුලේ අයගෙන් ප්‍රශංසා ලැබීම / ගුරුවරුන්ගෙන් ප්‍රශංසා ලැබීම (ආදී නිවැරදි අදාළ පිළිතුරුවලට ලකුණු දෙන්න.)

02 (i) A කාලය ඉතුරුවෙයි. B කාර්යය පහසු කරයි. C. සතුටක් ඇති කරයි.
D. ආත්ම විශ්වාසය ඇති වෙයි. E. ගැටලු අවම වෙයි
(අක්ෂර මාරුකර ලියා තිබුණත් ලකුණු දෙන්න)
(ii) <u>සැලසුම්සහගත ශිෂ්‍යයා</u>
ක්‍රමානුකූලව කටයුතු කරයි / තම අරමුණ ඉටු කරගනියි / අභියෝග ජය ගනියි
<u>සැලසුම් සහගත නොවූ ශිෂ්‍යයා</u>
වැඩ කල්දමයි / පසුතැවීමට ලක්වෙයි / ආතතියෙන් යුතුවෙයි

03 (i) පාසලේ දැක්ම / ආදර්ශපාඨය / නිල ලාංඡනය / මෙහෙවර / නිල ඇඳුම
(ii) උදෑසන රැස්වීමේ දී / නිවාසාන්තර ක්‍රීඩා උත්සවයේ දී වෙනත් උත්සව අවස්ථාවල දී
(iii) ළමයින් තුළ ශික්ෂණය ගොඩනැගීම / ආත්මාභිමානයෙන් යුතු පිරිසක් බිහිවීම / පාසැලේ අනන්‍යතාවය ආරක්ෂා වීම /අනාගත සිසු පරපුරට ඒවා පවරාදීමට හැකිවීම

04 (i) A - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය B - දිස්ත්‍රික්කය C - රට
(ii) නිවාස ඉදිකිරීම / ආහාර වර්ග වගා කරීම / කර්මාන්තශාලා සඳහා ගොඩනැගිලි ඉදි කිරීම / මංමාවත් ඉදිකිරීම / ජලාස ඉදිකිරීම ආදී නිවැරදි පිළිතුරුවලට ලකුණු දෙන්න.
(iii) වනාන්තර සුරකීම / සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම / සම්පත් නාස්තිය අවම කිරීම / පාංශු සංරක්ෂණය (පෙළපොත 56 පිටුව)

05 (i) කායික හැකියා - ගොවියා / වඩුකාර්මිකයා (B, D)
මානසික හැකියා - වෛද්‍යවරයා / සංගීතඥයා (A, C)
(ii) මැටි - වළං / ගඩොල්
කොහු - කොසු / පාපිසි / මෙට්ට / ලණු
ඉරටු - ඉදල් / විසිතුරු භාණ්ඩ (ආදී නිවැරදි ආදළ පිළිතුරුවලට ලකුණු දෙන්න.)
(iii) සුහදත්වය ඇති වේ / වින්දනයක් ලැබේ / කාලය ඉතිරි වේ. (පිටුව 61)

06 (i) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය / රෝහල / ප්‍රාදේශීය සභා / නගර සභා / මහනගර සභා / ආගමික සිද්ධස්ථාන
(ii) අවමංගල්‍යාධාර සමිතිය - අවමංගල්‍යය සේවා සැපයීම / සුබසාධක සේවා සැපයීම
සමුපකාර සමිතිය - සහනදායී වෙළෙඳාම / ණය දීම / කෘෂි ද්‍රව්‍ය මිලදී ගැනීම / ඉතුරුම් වර්ධනය කිරීම
ගොවි සමිතිය - උපදෙස් ලබා දීම / සහනාධාර ලබා දීම / සුභසාධන සේවා සැපයීම.
(iii) නිසිපරිදි බදු මුදල් ගෙවීම / සේවා සපයන ආයතන හා දේපළ රැක ගැනීම. (පෙළපොත 70 පිටුව)

07 (i) පහලට
(1) අවධානය (2) සංවරශීලීබව (5) සාමකාමී
හරහට
(3) අවස්ථාව (4) ඉවසීම (6) යහපත්
(ii) පොදුවේ සැමට පරිහරණය කළ හැකි වීම / ලාභ අපේක්ෂාවෙන් තොරව රජය මගින් පනවා තිබීම / මහජන සුබසිද්ධය හා මහජනතාවට සේවා සැපයීම අරමුණු කරගෙන පවත්ගෙන යාම.
(iii) පොදු දේපල අයතා ලෙස පරිහරණය කිරීමෙන් වැළකීම / භාවිතා කිරීමේ දී කැඩී බිඳී යාමෙන් ආරක්ෂා කිරීම.